21

ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அநுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி. 4ம் மாடி "அ" ஹரிச் சந்திரா வீதி, மாவத்த, அநுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ලේකම් / செயலாளர் / Secretary

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
Fax: 025-2224914
E-mail: csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/05/07/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.08.04


ආයතන චක්‍රලේඛ ලිපි - 2022/01(II)

උතුරු මැද පළාතේ සියළුම ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
පළාත් ආදායම් කොමසාරිස්,

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව මවිසින් නිකුත් කර ඇති අංක 2022/01 හා 2022/05/31 දිනැති ආයතන චක්‍රලේඛ ලිපිය හා බැඳේ.

02. ඒ අනුව උක්ත චක්‍රලේඛයෙහි කාර්යාලයට පැමිණීම යටතේ වන 02 ඡේදය අනුව සෑම සිකුරාදා දිනයක්ම සාමාන්‍ය පරිපාලන කටයුතු වල යෙදෙන සියළුම කාර්යාල වසා තැබිය යුතු බව මවිසින් දැනුම් දී ඇත.

03. ඉහත පරිදි සිකුරාදා දිනය කාර්යාලය වසා තැබීමට ගත් තීරණය සම්බන්ධව නිකුත් කර තිබූ අංක 15/2022 හා 2022/06/15 දිනැති චක්‍රලේඛය 2022/08/03 දිනැතිව නිකුත් කොට ඇති 15/2022(I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් අවලංගු කර ඇති බැවින්, මින් ඉදිරියට සතියේ සිකුරාදා දිනය නිවසේ සිට රාජකාරි සිදු කරන දිනයක් නොවන බවත්, සාමාන්‍ය පරිදි රාජකාරි කරන දිනයක් ලෙස සලකා කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.